තුම්පනේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 14 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.6,196,686 ක් වුවත්, එම ශේෂය රු.6,178,361 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.18,325 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතු වටිනාකම රු.53,592,387 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.102,400 ක් විය. අවුරුදු 01 ත් 05 ත් අතර කාලයට අදාළ හිඟ ගිණුම් ශේෂයන් හි එකතුව රු.4,823,349 ක් වූ අතර, 2018 අප්‍රේල් 30 දිනට රු.35,191,491 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.53,507,927 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකමින් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.12,058,473 ක් වී තිබුණි. 2018 අප්‍රේල් 30 දිනට රු.40,829,266 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි.

**1.3.3** අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) | 59 හා 61 | -- | සමාලෝචිත වර්ෂය සඳහා සභා බල ප්‍රදේශය තුළ වෙළඳ බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| | (ii) | 178 (7) | 308,412 | භාණ්ඩ මිල දී ගැනීම සඳහා ටෙන්ඩර් භාර ගැනීමේ දී ලියාපදිංචි තැපැලෙන් හෝ මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගත යුතු වුවත්, අත් මිල ගණන් ලබා ගෙන අවස්ථා 07 කදී භාණ්ඩ මිලදී ගෙන තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | | මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | -- | අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දවස් 07 කට වඩා කල් ගත වන්නේ නම්, ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, බැකෝ යන්ත්‍රයේ අනතුර සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ | | | |
| | (i) | 2007 මැයි 17 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(iv) ඡේදය | 54,714 | නැවත සේවයේ යොදවා ගෙන තිබූ විශ්‍රාමික ආදායම් පරීක්ෂක නිලධාරීවරයෙකුට 2017 ජනවාරි 25 දින සිට මාස 11 කුත් දින 07 ක කාලයක් සඳහා අන්තර් දීමනාවක් චක්‍රලේඛ විධිවිධානවලින් පරිබාහිරව ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 6 ඡේදය | -- | නව තක්සේරුවක් ලබාගත් පසු නව බදු කුලිය ඇතුළත්ව බදු ගිවිසුම සංශෝධනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී බදු කුලිය සංශෝධනය කර තිබූ කඩ කාමර 19 ක ගිවිසුම් සංශෝධනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,666,137 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,456,901 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,980,000 | 4,253,428 | 3,376,362 | 2,129,228 | 1,225,249 | 1,993,668 | 1,987,277 | 1,252,162 |
| (ii) | කුලී | 5,155,000 | 3,000,268 | 2,882,981 | 924,297 | 5,252,784 | 4,812,066 | 5,057,900 | 800,084 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,764,000 | 1,533,043 | 1,533,043 | -- | 2,970,000 | 1,526,108 | 1,526,108 | -- |
| (iv) | වෙනත් ආදායම් | 10,708,000 | 8,872,630 | 4,900,161 | 11,406,155 | 10,251,500 | 8,297,794 | 17,123,050 | 8,059,455 |
| | එකතුව | 21,607,000 | 17,659,369 | 12,692,547 | 14,459,680 | 19,699,533 | 16,629,636 | 25,694,335 | 10,111,701 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමස්ථ ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.10,111,701 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.14,459,680 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 42 ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

**(අ) වරිපනම්**

2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.444,097 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම රු.2,896,875 ක් විය. මින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.173,511 ක් හා රු.2,006,805 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 39 ක් හා සියයට 70 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.1,160,656 ක හිඟ ශේෂයක්

පැවති බැවින්, හිඟ ආදායම් අය කිරීම දුර්වල මට්ටමක පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කසළ බදු

------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.196,000 ක කසළ බදු ශේෂයක් වර්ෂ 02 ක කාලයක සිට හිඟව පැවතුණි.

(ඇ) ජල බදු

---------

(i) 2017 ජනවාරි 01 දිනට හිඟ ජල ගාස්තුව රු.612,065 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.573,053 ක් විය. මින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.248,069 ක් හා රු.444,147 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 40 ක් හා සියයට 77 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට රු.492,902 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ii) දැනට අක්‍රීයව පවතින ජල යෝජනා ක්‍රම 03 ක ජල පාරිභෝගිකයින් 341 දෙනෙකුගෙන් රු.290,569 ක ජල ගාස්තුවක් හිඟ හිට තිබුණි.

2.2.4 කුලී

------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 52 කින් රු.861,381 ක බදු කුලී මුදලක් මාස 03 ත් අවුරුදු 02 ත් අතර කාල පරාසයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, එම කඩ කාමර සම්බන්ධයෙන් බදු ගිවිසුමේ 22 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු කඩ කාමර 25 ක් සම්බන්ධව තක්සේරු වාර්තා 2016 නොවැම්බර් 25 දින ලැබී තිබුණ ද, එම වාර්තා පදනම් කර ගෙන කඩ කුලී සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සභාවට රු.383,940 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) බදු ගිවිසුමට අනුව, බදු දී ඇති කඩ කාමරවල මාසික කුලිය මෙන් තුන් ගුණයක ඇප මුදලක් තැන්පතුවක් ලෙස තබා ගත යුතු වුවත්, කඩ කුලී සංශෝධනය කර තිබූ කඩ කාමර 19 ක මාස 03 ක තැන්පතු මුදල වූ රු.110,880 ක් සංශෝධනය කර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ අංක 11 කඩ කාමරය 2015 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) බාහිර පුද්ගලයෙකු විසින් හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ අංක 04 දරන කඩ කාමරය කුලී ගෙවීමකින් තොරව අනවසරයෙන් ලබා ගෙන 2016 අගෝස්තු මස සිට පරිගණක ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ඔහු විසින් වෙනත් පාර්ශවයකට අතුරු බදු දී තිබුණ ද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කඩ කාමරය සභාවට පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන්, සභාවට දළ වශයෙන් රු.56,000 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,000,000 ක් හා මුද්දර ගාස්තු රු.9,185,370 ක් විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

---------------------------

**3.1** කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ **03** වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අරමුණුගත කාර්යන් ඉටු නොකිරීම

----------------------------------------

(i) වැඩසටහන් අංක **03** යටතේ **304 – 4** වැය විෂයයෙන් මංමාවත් හා පදික වේදිකා අලුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට වෙන් කර තිබූ රු.**200,000** ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපයෝජනය කර අදාළ අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වැඩසටහන් අංක **02** වෛද්‍ය සැපයීම් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(a) වැය විෂයය **203 – 3** වෛද්‍ය සැපයුම් සඳහා රු.**100,000** ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, එම ප්‍රතිපාදන උපයෝජනය කර, අදාළ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කිරීමකින් තොරව එම ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.

(b) වැය විෂය **205 - 5** සෞඛ්‍ය වැඩසටහන් සඳහා රු.**200,000** ක ප්‍රතිපාදන වෙන් කර ඇතත්, වර්ෂය තුළ දී රු.**23,576** ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට **23** ක් විය.

(iii) වැඩසටහන් අංක **06** යටතේ වැය විෂයය **602–2** සුභ සාධක ගෙවීම් සඳහා රු.**50,000** ක් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබුණ ද, එම ප්‍රතිපාදන උපයෝජනය කර අදාළ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

(i) කසළ දිරන හා නොදිරන වශයෙන් වෙන් කර දිනකට ටොන් **01** ක් පමණ එකතු කළත් එකී දිරන කසළ භාවිතා කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම හෝ වෙනත් ක්‍රමවේදයක් අනුගමනය නොකර අවිධිමත්ව බැහැර කර තිබුණි.

(ii) නොදිරන කසළ අතර ඇති පොලිතීන්, ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙළක් අනුගමනය කිරීමකින් තොරව පරිසරයට හානී වන අයුරින් කසළ අංගනය තුළ දහනය කරමින් තිබුණි.

(ii) කසළ බැහැර කරනු ලබන දික්ඔයවත්ත ඉඩමේ කසළ අංගනය සඳහා **2018** අප්‍රේල් **03** දින දක්වා පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂයට අදාල සංයුක්ත සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) විවිධ කාර්යයන් වෙනුවෙන් අවස්ථා 05 කදී ලබා දී තිබූ රු.39,956 ක අත්තිකාරම් මුදල් හා ගලගෙදර සුජාතා බාලිකා විද්‍යාලය ඉදිරිපිට වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කාර ආයතනය වෙත ලබා දී තිබූ රු.883,334 ක අත්තිකාරම් මුදල් වසර 03 ත් වසර 09 ත් අතර කාල පරාසයක සිට පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නව ජල සම්බන්ධතා ලබා දීම වෙනුවෙන් පාරිභෝගිකයින් 26 දෙනෙකුගෙන් අය වීමට ඇති සම්බන්ධතා ගාස්තු රු.67,295 ක් 2014 වර්ෂයේ සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර තනතුරු 20 ක පුරප්පාඩු පැවතිණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර අනුමත කිරීමෙන් පසු ඒ නිවාසවල පදිංචි වීමට පෙර අනුකූලතා සහතික නිකුත් කළ යුතු වුවත්, 2014 සිට 2017 දක්වා කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍ර 439 ක් වෙනුවෙන් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 48 ක් සඳහා පමණි.

(ආ) 2013 වර්ෂයට කඩ කාමර බදු දීමේ දී, ටෙන්ඩර්කරුවන් 15 දෙනෙකුගෙන් එකවර අය කර ගත් ටෙන්ඩර් තැන්පතු මුදල් රු.5,562,370 ක්, තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

3.5.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

වටිනාකම හඳුනාගත නොහැකි ලැප් ටොප් පරිගණකයක් සහ රු.3,000 ක් වටිනා පා පැදියක් වසර 06 ත් වසර 28 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති අතර, රු.25,161,056 ක් වටිනා මෝටර් ග්‍රේඩරයක් හා මෝටර් සයිකල් 03 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි බිම් ඇතුරුම් ගල් නිෂ්පාදන යන්ත්‍රයක් හා සිමෙන්ති ගල් නිෂ්පාදන යන්ත්‍රයක් වසර 03 ත් වසර 20 ත් අතර කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

3.5.2 වාහන උපයෝජනය

-----------------------

සභාව සතු වාහන 02 ක ධාවන සටහන් හි වාහනය පාවිච්චි කරන නිලධාරියා අත්සන් කර සහතික කිරීමකින් තොරව කි.මී.3011 ක් ධාවනය කර තිබුණි. ඒ වෙනුවෙන් ඉන්ධන සඳහා රු.49,717 ක් වැය කර තිබුණි.

**3.6** ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

ගලගෙදර සුජාතා බාලිකා විදුහල ඉදිරිපිට පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා රු.2,309,526 ක් වැය කර තිබුණි. අදාළ ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි සිදු නොකර, ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් එම ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත ආදායම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ඉදිකිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබා ගත් රු.2,500,000 ක ණය මුදලට සාපේක්ෂව කිසිදු ප්‍රතිලාභයක් නොලබා, 2017 දෙසැම්බර් 31 දින වන විට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවා තිබූ පොලිය රු.576,418 ක් විය.

**3.7** හඳුනා ගත් අලාභ

--------------------

2014 සැප්තැම්බර් 30 දින පැවති මහා සභාවේ අංක 08(xvi) දරන තීරණය පරිදි වර්ෂයක කාලයක් සඳහා පමණක් තක්සේරු බදු කුලියෙන් සියයට 50 ක් අය කළ යුතු වුවත්, සභා තීරණයට පරිබාහිරව කටයුතු කර 2015 ජනවාරි 01 දින ගිවිසුමට එළඹ වර්ෂ 05 ක කාලයක් සඳහා සියයට 50 ක බදු කුලී අය කිරීමට ගිවිසුම්වලට එළඹ තිබුණි. මේ හේතුවෙන්, සහන කාලය වූ 2015 අත්හැරීමෙන් පසුව 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් තක්සේරු බදු කුලියෙන් සියයට 50 ක් අඩු කර, බදු කුලී අය කිරීම හේතුවෙන් සභා අරමුදලට රු.1,522,600 ක පාඩුවක් සිදු කර තිබුණි.

**3.8** ප්‍රසම්පාදනය

----------------

**3.8.1** ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

රු.43,815,506 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**3.8.2** කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) මුතුකෙළියාව සිට කහටාංග හරහා දිඹුල්කුඹුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.1,947,334 කට ඇස්තමේන්තු කර වැඩ අවසන් කර තිබූ කර්මාන්තයේ 2018 පෙබරවාරි 22 දින වන විට ගෙවීම් අවසන් කර නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කොන්ක්‍රීට් මාර්ග තලයේ ආරම්භයේ සිට අවසානය දක්වා කොන්ක්‍රීටය දෙපස මාර්ගය අභ්‍යන්තරය දක්වා විහිදෙන පරිදි බොහෝ ස්ථානවල හනි කොම්බ් (Honey Comb) ලක්ෂණ මතු වී තිබුණි.

(ii) කොන්ක්‍රීට් මාර්ග තලය කඩා පරීක්ෂා කිරීමේ දී පහසුවෙන් කැඩිය හැකි පරිදි එහි කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ii) මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තත්ත්ව පරීක්ෂණ වාර්තාවකට අනුව අදාළ කොන්ක්‍රීට් මාර්ග තලයේ කොටස් 03 කින් ස්ථාන 08 ක් නිරීක්ෂණය කර පරීක්ෂණ වාර්තාව සකස් කර තිබූ අතර, එම ස්ථාන 08 න් ස්ථාන 05 ක සම්පීඩන (FC) අගය 20 $N/mm^2$ ට වඩා අඩු වී තිබුණි.

(ආ) නාමල්තැන්න ගොරකගහමුල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.1,977,569 කට ඇස්තමේන්තු කර වැඩ අවසන් කර තිබූ කර්මාන්තයේ ගෙවීම් අවසන් කර නොතිබූ අතර, පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා කොන්ක්‍රීටය දෙපස මාර්ගය අභ්‍යන්තරය දක්වා විහිදෙන පරිදි හනි කොම්බ් (Honey Comb) ලක්ෂණ දක්නට ලැබුණි.

(ii) කොන්ක්‍රීට් මාර්ග තලය කඩා පරීක්ෂා කිරීමේ දී එම කොන්ක්‍රීටය පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(iii) ඇස්තමේන්තු ප්‍රකාරව කොන්ක්‍රීට් මාර්ග තලය අගල් 06 ක් ඝනකමින් යුතුව ඉදිකළ යුතු වුවත්, එය කඩා පරීක්ෂා කිරීමේ දී එහි ඝනකම අගල් 05 ක් පමණ විය.

(iv) මාර්ගයට යාබදව යොදා තිබූ කොන්ක්‍රීට් කාණුවේ දෙපස බොහෝ ස්ථානවල හනි කොම්බ් (Honey Comb) ලක්ෂණ දක්නට ලැබුණි.

(v) මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ද්‍රව්‍ය රසායනාගාරයෙන් හා පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ Hammer test පරීක්ෂණ මගින් ලබා ගත් මාර්ග තලයේ කොන්ක්‍රීට්වල තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව, මිශ්‍රණයේ තත්ත්වය සාමාන්‍යයෙන් (Average) පිළිවෙළින් 18.2 $N/mm^2$ ක් හා 15 $N/mm^2$ ක් වූ අතර, එම වාර්තාවලට අනුව මාර්ගයේ කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණය අසමත් වී තිබුණි.

(ඇ) කෝපිවත්ත 10 කණුව මාර්ගය කාණු පද්ධතිය සකස් කිරීම සඳහා රු.6,987,710 ක මුදලකට ඇස්තමේන්තු කර වැඩ අවසන් කළ කර්මාන්තයේ ගෙවීම් අවසන් කර නොතිබූ අතර, පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) රු.5,129,131 ක වටිනාකමකින් සමන්විත මී.920 ක් දුරට මාර්ගයට යාබදව ඉදිකර තිබූ කොන්ක්‍රීට් කාණුව පතුලේ ස්ථාන කීපයක කොන්ක්‍රීට් මිශ්‍රණය පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ ඉතා දුර්වලව පැවතිණි. කොන්ක්‍රීටය කඩා පරීක්ෂා කිරීමේ දී එහි මිශ්‍රණය මඩ සහිත අවපාට වැලි මිශ්‍රණයක් දක්නට ලැබුණි. යොදා තිබූ අඟල් ¾ මැටල් පහසුවෙන් කුඩු වී යන ස්වභාවයක් දක්නට ලැබුණි.

(ii) මාර්ගයට යාබදව ඉදිකර තිබූ කොන්ක්‍රීට් කරන ලද කාණුව ආරම්භයේ සිට මී.300 ක් පමණ දුරක්, මි.මී.200 ත් මි.මී.370 අතර පරාසයකින් කොන්ක්‍රීට් මාර්ග තලයෙන් ඉහළට ඉදිකර තිබුණි. මේ හේතුවෙන්, මාර්ග තලය හරහා ගමන් කරන වැසි ජලය කාණුවට ගලා බැසීමට නොහැකිව මාර්ගයට ගලා යාමෙන් කොන්ක්‍රීට් කාණු යෙදීමේ අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

(iii) කාණුව පතුල දෙපස බොහෝ ස්ථානවල හනි කොම්බ් (Honey Comb) ලක්ෂණ මතු වී තිබුණි.

(iv) මෙම කාණුව ඉදිකිරීම සඳහා යොදා ගෙන තිබූ අඟල් ¾ ප්‍රමාණයේ මැටල් පිළිබඳව තත්ත්ව පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

(ඇ) ගල්ලෙනවත්ත ඉරිවේරියගල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.177,021 ක මුදලක් 2017 දෙසැම්බර් 29 දින ගෙවා තිබුණි. යථෝක්ත කොන්ක්‍රීට් මාර්ග තලයේ ආරම්භයේ සිට අවසානය දක්වා කොන්ක්‍රීටය දෙපස මාර්ග තලයේ අභ්‍යන්තරයට විහිදෙන පරිදි හනි කොම්බ් (Honey Comb) ලක්ෂණ මතු වී තිබූ අතර, එම ස්ථාන කඩා පරීක්ෂා කිරීමේ දී පහසුවෙන් කැඩිය හැකි දුර්වල සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයක් යොදා තිබුණි.

(ඉ) කසළ බහාලන ඉඩමේ කසළ අට්ටි ගසන ස්ථානය වැඩි දියුණු කිරිම සඳහා රු.3,000,000 කට ඇස්තමේන්තු කර වැඩ අවසන්ව තිබූ කර්මාන්තයේ ගෙවීම් කටයුතු කර නොතිබූ අතර, පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ වට පිළ ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී, පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ ඉතා දුර්වල සිමෙන්ති වැලි මිශ්‍රණයක් යොදා තිබුණි.

(ii) ඉදිකර තිබූ වට පිළේ මතු පිට ස්ථාන කීපයක් පුපුරා ඉරි තලා තිබුණි.

(iii) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 5.3 හි සඳහන් පරිදි ගොඩනැගිල්ල ඇතුළත පොළවට යොදා තිබූ කොන්ක්‍රීටයේ ඝනකම අඟල් 05 ක් විය යුතු වුවත්, එහි ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී එහි ඝනකම අඟල් 4 ක් බව නිරීක්ෂණය විය. එමෙන්ම, මෙම කොන්ක්‍රීටයේ මතු පිට සිට අඟල් 02 කින් පමණ පහළ සිට පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(iv) ඉහත සඳහන් පරිදි බිමට යොදා තිබූ කොන්ක්‍රීටය බොහෝ ස්ථානවල හරස් අතට හා දික් අතට පුපුරා ඉරි තලා ගොස් තිබුණි.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයන් 02 ක සියයට 24 සිට සියයට 29 දක්වා ද, වියදම් විෂයන් 03 ක සියයට 26 සිට සියයට 217 ක් දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.** පද්ධති හා පාලන

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ------------ |
| (අ) | අයවැය පාලනය | | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වැය නොකිරීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | i. | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |
| | | ii. | වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්තවල බොහෝ අඩු පාඩු පැවතීම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය නොකිරිම. |
| | | ii. | විධිමත් සමීක්ෂණයක් කර ආදායම් ඒකක හඳුනා නොගැනීම. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | i. | විධිමත් සමීක්ෂණයක් කර සභාව සතු වත්කම් හඳුනා නොගැනීම. |
| | | ii. | වත්කම් ඌන උපයෝජිතව පැවතීම. |
| (ඉ) | ණයගැතියෝ හා ණයහිමියෝ | | ණයගැති ණයහිමි ශේෂ නිරවුල් නොකිරීම. |